# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මැයි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ : රු. 1.50 යි. නැපැල් ගාස්තුව : රු. 1.15 යි.

# 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 24 වන දින]

**එල්. ඩී.—ඕ. 19/88**

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව **විසින් මෙසේ පනවනු ලැබේ :—**

**1.** මේ පනත 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **1981 අංක 1 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) නාමයෝජනා කාලසීමාව, (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශනය හෝ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙන් පසුව එළඹෙන දහවන දින යෙන් ආරම්භව, ඒ ප්‍රකාශනය හෝ නියමය පළ කරනු ලැබූ දිනයෙන් පසුව එළඹෙන දහහත් වන දිනයේ මධ්‍යාහ්න දොළහට අවසන් විය යුතුය."

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) නාමයෝජනා කාලසීමාව අවසන් වන දිනයේ සිට සති පහකට නොඅඩු වූ ද සති හතකට නොවැඩි වූ ද කාලයක් ඇතුළත වූ දිනයක් විය යුතුය ;".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියෙහි (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන අපේක්ෂකයන් ලෙස තරග කරන (මෙහි මින්මතු "ස්වාධීන කණ්ඩායම" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තන් කණ්ඩායමක් විසින්, යම් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණයක් සඳහා, ඒ මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් ගණනට තුනකින් වැඩි සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවකගේ නම් දැක්වෙන එක් නාමයෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය. ඒ නාමයෝජනා පත්‍රය මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(2) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයාගේ ලිඛිත කැමැත්ත නාමයෝජනා පත්‍රයෙහි සටහන් කර තිබිය යුතු ය. තව ද සෑම අපේක්ෂකයකු විසින් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයේ දැක්වෙන ආකෘතියෙහි අවස්ථාවෝචිත පරිදි දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දී ඊට අත්සන් තබා නාමයෝජනා පත්‍රයෙහි සටහන් කර තිබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "99 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව" යන වචන සහ අංක වෙනුවට "99 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව" යන වචන හා අංක ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් එක් කෙනෙකුගේ හෝ ඊට වැඩි ගණනකගේ කැමැත්ත හෝ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයේ දැක්වෙන දිවුරුම හෝ ප්‍රතිඥාව හෝ නාමයෝජනා පත්‍රයෙහි සටහන් කර නොමැති අවස්ථාවක."; සහ

(3) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) නාමයෝජනා පත්‍රයකට විරෝධය දැක්වීමක් නාමයෝජනා කිරීමේ කාල සීමාවේ අවසාන දිනයේ මධ්‍යාහ්න දොළහත් පස්වරු එකයි තිහත් අතර කාලය තුළ තේරීම්භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ දිනයේ පස්වරු එකයි තිහෙන් පසු එවැනි විරෝධය දැක්වීමක් තේරීම් භාර නිලධරයා විසින් භාර ගනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) තෝරා පත්කර ගනු ලැබීම සඳහා, එක් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ එක් ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයන් පමණක් නාමයෝජනා කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ නාම යෝජනා පත්‍රයෙහි නම් සඳහන් වන අපේක්ෂකයන් අතුරින් කිනම් අපේක්ෂකයන් මන්ත්‍රීවරයන් ලෙස පත් වී ඇති බවට ප්‍රකාශ කළ යුතු දැයි, තේරීම් භාර නිලධරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් ඇතුළත, තීරණය කරන ලෙස, තේරීම් භාර නිලධරයා විසින් ඒ පිළි

ගත් දේශපාලන පක්ෂයෙහි ලේකම්වරයා වෙත හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා වෙත හෝ දන්වා සිටිය යුතුය. එම ලේකම්වරයා හෝ කණ්ඩායමේ නායකයා හෝ විසින්, තේරීම් භාර නිලධරයා නියම කළ කාල සීමාව ඇතුළත තම තීරණය තේරීම් භාර නිලධරයා වෙත දන්වා එවනු ලැබුව හොත්, එම තීරණයෙහි පිළිවෙලින් නිශ්චිත අපේක්ෂකයන්, මන්ත්‍රීවරයන් ලෙස තේරී පත්වී ඇතැයි තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය. අනෙක් අතට, තේරීම් භාර නිලධරයා විසින් නියම කරන ලද කාල සීමාව ඇතුළත තම තීරණය තේරීම් භාර නිලධරයා වෙත දන්වා, එවීම එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් පැහැර හරිනු ලැබුවහොත්, තෝරා පත්කර ගත යුතුව ඇති මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවක්, එම නාමයෝජනා පත්‍රයෙහි ඔවුන්ගේ නම් සඳහන් වී තිබෙන අනුපිළිවෙල අනුව, මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත්කර ගනු ලැබූ බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියෙහි (1) වන උප වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) එම මැතිවරණ කොට්ඨාශයේ මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා කරන ලද එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ සහ ස්වාධීන කණ්ඩායමේ සිංහල අකාරාදියේ අකාරාදි අනුපිළිවෙලට සකස් කරන ලද අපේක්ෂකයන්ගේ නම්, (ඔවුන් විසින් දක්වා ඇති පරිදි) ඒ එක් එක් අපේක්ෂකයාට පවරන ලද අනුක්‍රමික අංකය, ඒ පක්ෂයට හෝ කණ්ඩායමට හෝ වෙන් කර දෙන ලද අනුමත කරන ලද ලකුණ සහ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට ස්වාධීන කණ්ඩායම" යන වචන හා හඳුනාගැනීමේ අංකයක් වෙතොත් ඒ අංකය ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"නාමයෝජනා කරනු ලැබීමෙන් පසු අපේක්ෂකයකු මියයාම.

25. (1) ඡන්ද විමසීමේ කාර්යය සඳහා මැතිවරණය අඩාලව කල් තැබීමත් ඡන්ද විමසීම ආරම්භවීමත් අතර කාලය තුළ අපේක්ෂකයකුගේ මරණය සිදුවුණු කවර වූ විටක, ඒ මරණය සිදු වූ බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වීමෙන් පසු ඔහු විසින්, මියගිය අපේක්ෂකයා වෙනුවට වෙනත් අපේක්ෂකයකු නාමයෝජනා කරන ලෙස, අවස්ථෝචිත පරිදි මියගිය අපේක්ෂකයා නාම යෝජනා කරනු ලැබූ එම පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාට හෝ ලියවිල්ලකින් විධාන කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් ලැබුණු විට, අවශ්‍යාවෝචිත පරිදි, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් හෝ ඒ ස්වාධීන කණ්ඩායමෙහි කණ්ඩායම් නායකයා විසින් හෝ එම විධානය අනුව නාමයෝජනා කරන ලද අපේක්ෂකයාගේ නම සහ ලිපිනය කොමසාරිස්වරයා වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කිසියම් තොරතුරක් ලැබුණු විට, මියගිය අපේක්ෂකයාගේ නම නාමයෝජනා පත්‍රයෙන් කපාහැර (2) වන උපවගන්තිය යටතේ නාමයෝජනා කරන ලද අපේක්ෂකයාගේ නම නාමයෝජනා පත්‍රයෙහි ඇතුළත් කරන ලෙස කොමසාරිස්වරයා විසින් තේරීම් භාර නිලධරයාට විධාන කරනු ලැබිය යුතු ය. (1) වන උපවගන්තියේ සඳහන් අපේක්ෂකයාගේ මරණය සිදුවූ බව ප්‍රකාශ කරන්නා වූ ද, ඒ මරණය සිදු වුව ද මියගිය අපේක්ෂකයාගේ නම අත්හරිනු ලැබූ සහ (2) වන උපවගන්තිය යටතේ නාමයෝජනා කරන ලද අපේක්ෂකයාගේ නම ඇතුළත් කරනු ලැබූ නාමයෝජනා පත්‍රය වලංගු බව සහ 24 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමේ සඳහන් පරිදි ඡන්ද විමසීම පවත්වනු ලබන බව ප්‍රකාශ කරන්නාවූ ද දැන්වීමක් කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ එන "පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ" යන වචන වෙනුවට, "පොලිස් දෙපාර්තමේන්තුවේ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ආ) ඡන්ද පොළෙන් පිටත, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ හෝ අපේක්ෂකයන් විසින් දී ඇති පරිදි, සිංහල අකාරාදියේ අකාරාදි අනුපිළිවෙල අනුව අපේක්ෂකයන්ගේ නම්, ඒ එක් එක් අපේක්ෂකයාට පවරන ලද අනුක්‍රමික අංකය සහ ඒ එක් එක් පක්ෂයට හෝ කණ්ඩායමට හෝ වෙන්කර ඇති අනුමත කරන ලද ලකුණ ද සමග, මැතිවරණයේ දී තරග කරන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ නම හෝ මැතිවරණයේ දී තරග කරන ස්වාධීන කණ්ඩායමක් සම්

බන්ධයෙන් වන විට ඒ එක් එක් කණ්ඩායම සඳහා "ස්වාධීන කණ්ඩායම" යන වචන සහ ඒ එක් එක් කණ්ඩායම සඳහා වෙන් කර ඇති හඳුනාගැනීමේ අංක යක් වේනොත් ඒ අංකය දැක්වෙන දැන්වීමක්.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියෙහි (2) වන උප වගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ඒ සෑම ඡන්ද පත්‍රිකාවකම මැතිවරණයේ දී තරග කරන පිළිගත් දේශපාලන පක්ෂවල නම් සිංහල අකාරාදියේ අකාරාදී අනුපිළිවෙල අනුව අනුක්‍රමිකව දැක්වෙන සේ සකස් කොට ඒ පක්ෂවල නම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ඇතුළත් විය යුතු ය. ඒ එක් එක් පක්ෂයට වෙන් කර ඇති ලකුණ ඒ එක් එක් පක්ෂයේ නමට ඉදිරියෙන් දක්වා තිබිය යුතු ය. ඉන් ඉක්බිතිවම මැතිවරණයේ දී තරග කරන ස්වාධීන කණ්ඩායම් වේනොත් ඒ එක් එක් කණ්ඩායම සඳහා "ස්වාධීන කණ්ඩායම" යන වචන නැවත නැවත සඳහන් කොට හඳුනාගැනීමේ අංකයක් ඇත්නම් ඒ හඳුනා ගැනීමේ අංකය අනුක්‍රමිකව ද ඒ එක් එක් කණ්ඩායමට වෙන්කර ඇති ලකුණ ඒ එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ නම ඉදිරියෙන් ද ඇතුළත් විය යුතු ය. ඉන් ඉක්බිතිවම ඒ මැතිවරණ කොට්ඨාසයෙන් තෝරා පත්කර ගත යුතු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවට තුනක් එකතු කළ විට ලැබෙන ගණන අනුක්‍රමික වශයෙන් ඇතුළත් විය යුතුය ;".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "එසේ පත් කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපින එහි සඳහන් කොට" යන වචන වෙනුවට "එසේ පත් කරනු ලැබූ තැනැත්තන්ගේ නම්, ජාතික හැඳුනුම් පත් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම් පත් අංක සහ ලිපිනයන් එහි සඳහන් කොට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "අලුත් ඡන්ද ස්ථාන නියෝජිතයාගේ නම සහ ලිපිනය ද" යන වචන වෙනුවට "අලුත් ඡන්ද ස්ථාන නියෝජිතයාගේ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම් පත් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම් පත් අංකය ද" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය අගට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"එසේ වුව ද යම් එක් අවස්ථාවක දී එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් හෝ එක් අපේක්ෂකයකු පමණක් ඡන්ද පොළට ඇතුළු කරගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ පත් කරන ලද තැනැත්තන්ගේ නම්, ජාතික හැඳුනුම් පත් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම්පත් අංක සහ ලිපිනයන් ප්‍රකාශ කරන, ඒ පත්වීම් පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් හෝ බලය ලත් නියෝජිතයා විසින් හෝ කණ්ඩායම් නායකයා විසින් හෝ (2) වන උපවගන්තියේ සඳහන් අපේක්ෂකයා විසින් හෝ ඡන්ද ගණන් කිරීම ආරම්භ වීමට පෙර ගණන් කිරීමේ නිලධරයාට දෙනු ලැබිය යුතුය. යම් ගණන් කිරීමේ නියෝජිතයෙකුගේ නාම, ලිපිනය සහ ජාතික හැඳුනුම් පත් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම්පත් අංකය හෝ එසේ දැනුම් දී නොමැත්තා වූ ද ඒ ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පැමිණ සිටීමට බලය දෙන තේරීම් භාර නිලධරයාගෙන් ලිපියක් ඉදිරිපත් නොකරන්නා වූ ද ගණන් කිරීමේ නියෝජිතයකු, ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළු කර ගැනීම ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(7) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව වචනයෙන් මෙන්ම ඉලක්කමෙන් දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් ද, ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම හෝ විසින් නාම යෝජනා කරන ලද සෑම අපේක්ෂකයකු වෙනුවෙන් ම සඳහන් කොට ඇති මනාප ඡන්ද සංඛ්‍යාව වචනයෙන් මෙන්ම ඉලක්කමෙන් දැක්වෙන වෙනම ප්‍රකාශයක් ද ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙළ කරනු ලැබිය යුතු ය. ඒ එක් එක් ප්‍රකාශය ගණන් කිරීමේ නිලධරයා විසින් සහතික කරනු ලැබිය යුතු අතර, ඔහුගේ සහායකයන් හෝ ලිපිකරුවන් අතරින් එක් කෙනෙකු විසින් ද, පැමිණ සිටින හා අත්සන් කිරීමට කැමැත්ත දක්වන යම් පක්ෂ

යක හෝ කණ්ඩායමක ගණන් කිරීමේ නියෝජිතයන් විසින් ද ඊට සාක්ෂි වශයෙන් අත්සන් තබනු ලැබිය යුතු ය. ඉල්ලීමක් කරනු ලැබූ විට එම ප්‍රකාශය පිටපත් කර ගැනීමට ගණන් කිරීමේ නිලධරයා විසින් යම් ගණන් කිරීමේ නියෝජිතයකුට ඉඩ දිය යුතු ය.";

(2) එම වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(7අ) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් වෙනුවෙන්, ඡන්ද දායකයකු විසින් තම ඡන්ද පත්‍රිකාවෙහි සඳහන් කරන ලද මනාප, ඒ පක්ෂය හෝ කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් තුන් දෙනෙකුට වැඩි ගණනක් වෙනුවෙන් එම ඡන්ද දායකයා මනාප සඳහන් කොට ඇත් නම් නොසලකා හරිනු ලැබිය යුතු ය.

(7ආ) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු වෙනුවෙන්, ඡන්ද දායකයකු ස්වකීය ඡන්ද පත්‍රිකාවෙහි එක් මනාපයකට වැඩියෙන් මනාප සඳහන් කරනු ලබන අවස්ථාවක, එසේ සඳහන් කරන ලද සියලු මනාප, එක් මනාපයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7ඇ) මනාපය සඳහන් කරන ලද්දේ කිනම් අපේක්ෂකයාට ද යන්න පිළිබඳව අවිනිශ්චිත භාවය නිසා අවලංගු වන තම ඡන්ද පත්‍රිකාවෙහි, ඡන්දදායකයකු විසින් සඳහන් කරන ලද යම් මනාපයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියෙහි (ඌ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඌ) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට හෝ දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳව 53(7) වන වගන්තිය යටතේ වූ ලිඛිත ප්‍රකාශය සහ ඒ එක් එක් පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලද මනාප සංඛ්‍යාව.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) 55 වන වගන්තියෙහි සඳහන් ලේඛන ලැබුණු පසු, (තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලැබූ ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ මධ්‍යස්ථානවල හෝ ගණන් කිරීමේ නිලධරයන් ද ඇතුළුව) සියලුම ගණන් කිරීමේ නිලධරයන් විසින්

53 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ තමා වෙත සපයන ලද ප්‍රකාශවලින්, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව සහ එවැනි එක් එක් පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් සඳහන් කොට ඇති මනාප සංඛ්‍යාව ද තෝරීම් භාර නිලධරයා විසින් එකතු කොට නිශ්චය කළ යුතු ය. තෝරීම් භාර නිලධරයා විසින් 55 වන වගන්තියේ (ඌ) ඡේදයේ සඳහන් මුද්‍රා තබන ලද පැකැට්ටුවක් විවෘත කිරීමට පෙර 58 වන වගන්තිය යටතේ පත් කරන ලද නියෝජිතයකු විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒ පැකැට්ටුවේ මුද්‍රා පරීක්ෂා කිරීමට තෝරීම් භාර නිලධරයා විසින් ඒ නියෝජිතයාට අවසර දෙනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(3) යම් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයේ නම් දැක්වෙන සියලුම අපේක්ෂකයන් තෝරී පත්වීම නිසා හෝ අන් ආකාරයකින් අවසන් වී හෝ එම නාම යෝජනා පත්‍රයේ තමන්ගේ නම් ඉතිරිව ඇති අපේක්ෂකයන්ගෙන් කිසිවකු යම් මනාප ලබා නොමැතිව හා ඉන්පසුව ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද සාමාජිකයකුගෙන් පිරවිය යුතු පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, ඒ මැතිවරණ කොට්ඨාසයේ තෝරීම් භාර නිලධරයා විසින් ඒ බව කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය ඉවත් කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියෙහි (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇඇ) ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පොළක් ඇතුළත දී චුවමනාවෙන් ම ප්‍රදර්ශනය කරන ; හෝ",

ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "අඛණ්ඩ කාලයක් වැටුප් සහිත නිවාඩු ඒ වෙනත් තැනැත්තාට දෙනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "අඛණ්ඩ කාලයක් වැටුප් අහිමිවීමක් නොමැතිව ඒ වෙනත් තැනැත්තකුට ලියවිල්ලකින් දෙනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) සෑම සේවා යෝජකයකු විසින් ම —

(අ) (1) වන උපවගන්තිය යටතේ නිවාඩු ඉල්ලුම් කරන තැනැත්තන්ගේ නම්; සහ

(ආ) එම උපවගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන තැනැත්තන්ගේ නම් සහ ඒ තැනැත්තන්ට ඒ නිවාඩු දෙනු ලැබුවේ කවර කාලපරිච්ඡේද සඳහා ද යන වග

දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කළ යුතු අතර එම ප්‍රකාශය සේවා ස්ථානයේ ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය."; සහ

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තියේ විධිවිධාන" යන වචන සහ ඉලක්කම වෙනුවට "(1) වන උපවගන්තියෙහි හෝ (1අ) උපවගන්තියෙහි විධිවිධාන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ඡන්දය විමසීම පවත්වනු ලබන දිනට පෙර හත්වන දිනය" යන වචන වෙනුවට "ඡන්දය විමසීම පවත්වනු ලබන දිනයට පෙර දහවන දිනය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) ඡන්ද විමසීමේ දිනයට පෙර දහවන දිනයට පසුව (1) වන උපවගන්තියෙහි සඳහන් එවැනි කිසිම තැපැල් සන්දේශයක් තැපැල්පතිවරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ භාරදීම සඳහා පිළිගනු නොලැබිය යුතු ය. නැතහොත් ඡන්ද විමසීමේ දිනයට පෙර පස්වන දිනයට පසුව ඡන්ද හිමියකුට ඔහු විසින් භාර දෙනු නොලැබිය යුතු ය.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (2) (1) වන උපවගන්තියෙහි සඳහන් කාලය ඇතුළත ගුවන් විකාශන පහසුකම් ප්‍රයෝජනයට ගැනීම සඳහා එම උපවගන්තිය යටතේ ඉල්ලුම් කරන පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට,—

(අ) ගුවන් විදුලි විකාශන සම්බන්ධයෙන් වන විට,—

(i) එම පක්ෂය හෝ කණ්ඩායම හෝ විසින් එක් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් පමණක් නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් විනාඩි තිහක මුළු කාලයක් ; හෝ

(ii) එම පක්ෂය හෝ කණ්ඩායම විසින් මැතිවරණ කොට්ඨාස එකකට වැඩි නමුත් දහහතරකට අඩු ගණනකට නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් හෝ එය විසින් නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කළ මැතිවරණ කොට්ඨාස සඳහා අපේක්ෂකයන් එකසිය තිස් දෙදෙනෙකුට නො අඩු ගණනක් නාමයෝජනා කර ඇති අවස්ථාවක විනාඩි හැටක මුළු කාලයක් ;

(iii) එම පක්ෂය හෝ කණ්ඩායම විසින් මැතිවරණ කොට්ඨාස දහහතරකට හෝ ඊට වැඩි ගණනකට නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් හෝ එය විසින් නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කළ මැතිවරණ කොට්ඨාස සඳහා අපේක්ෂකයන් එකසිය තිස් දෙදෙනකුට වැඩි ගණනක් නාමයෝජනා කර ඇති අවස්ථාවක විනාඩි අනූවක මුළු කාලයක් ;

(ආ) රූපවාහිනී විකාශන සම්බන්ධයෙන් වන විට—

(i) එම පක්ෂය හෝ කණ්ඩායම විසින් එක් මැතිවරණ කොට්ඨාසයකට පමණක් නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් විනාඩි තිහක මුළු කාලයක් ; හෝ

(ii) එම පක්ෂය හෝ කණ්ඩායම විසින් මැතිවරණ කොට්ඨාස එකකට වැඩි නමුත් දහහතරකට අඩු ගණනකට නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් හෝ එය විසින් නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කළ මැතිවරණ කොට්ඨාස සඳහා අපේක්ෂකයන් එකසිය තිස් දෙදෙනකුට නො අඩු ගණනක් නාම යෝජනා කර ඇත්නම් විනාඩි හැටක මුළු කාලයක් ;

(iii) එම පක්ෂය හෝ කණ්ඩායම විසින් මැතිවරණ කොට්ඨාස දහහතරකට හෝ ඊට වැඩි ගණනකට නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් හෝ එය විසින් නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කළ මැතිවරණ කොට්ඨාස සඳහා අපේක්ෂකයන් එකසිය තිස් දෙදෙනෙකුට වැඩි ගණනක් නාම යෝජනා කර ඇත්නම් විනාඩි අනූවක මුළු කාලයක්

එම පහසුකම් ප්‍රයෝජනයට ගැනීමට ඉඩදිය යුතු ය.

එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව වෙන් කර දී ඇති කාලය එම පක්ෂය හෝ කණ්ඩායම විසින් එක් අවස්ථාවක දී හෝ එක් එක් අවස්ථාවේ දී විනාඩි පහළොවකට නොඅඩු වූ ද විනාඩි තිහකට නොවැඩි වූ ද වාර ගණනක දී ප්‍රයෝජනයට ගැනෙන පරිදි ඊට වැඩි අවස්ථා ගණනක දී හෝ ප්‍රයෝජනයට ගත හැකි ය.

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයාගේ සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) එම වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

"(7) (2) වන උපවගන්තිය යටතේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වෙන් කර දෙන ලද කාල සීමාවට අමතරව, (2) වන උපවගන්තියේ දැක්වෙන ප්‍රතිපත්ති ගැන සැලකිලිමත් ව, කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාල සීමා සඳහා, ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන පහසුකම් පාවිච්චි කිරීමට, සෑම පිළිගත් දේශපාලන පක්ෂයකට ම හෝ ස්වාධීන කණ්ඩායමකට ම කොමසාරිස්වරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(8) නාමයෝජනා පත්‍ර භාර ගන්නා දිනයෙන් ආරම්භව ප්‍රතිඵලය ප්‍රකාශ කිරීමේ දිනයෙන් අවසාන වන කාල පරිච්ඡේදය ඇතුළත යම් නිශ්චිත දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ නිශ්චිත අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිඵලය ඇති වන මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන මගින් විධිවිධාන සලසා ඇති පරිදි හැර, කිසිම දෙයක් ගුවන් විදුලියෙන් හෝ රූපවාහිනියෙන් ප්‍රචාරය නොවන බවට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වග බලාගත යුතු ය. මේ උප වගන්තියේ විධිවිධාන ක්‍රියාවට නැංවීමේ දී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා කොමසාරිස්වරයා විමසා කටයුතු කළ යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 127 අ වන සහ 127 ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම.*

23. මෙහි පහත දැක්වෙන වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය එහි 127අ වන සහ 127ආ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතුය :—

*“ පොලිසිය කොමසාරිස්වරයාට සහාය විය යුතු බව.*

127අ. මේ පනත යටතේ පැවැත්වෙන මැතිවරණයක් නිසි ආකාරව පැවැත්වෙන බවට සෑම පොලිස් නිලධරයකුම වග බලාගත යුතු අතර ඒ සම්බන්ධව කොමසාරිස්වරයා විසින් ඔහුට කරන යම් විධානයක් අනුව කටයුතු කළ යුතුය.

*නියමිත ඡන්ද පොළේ දී ඡන්දය දීමට නොහැකිවීම පිළිබඳ සාධාරණ බියක් ඇති විට ඡන්දය දීමේ කාර්ය පටිපාටිය.*

127ආ. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇතද, තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතු කොටගෙන එම ඡන්ද පොළේ දී තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්ද හිමියකු විසින්, තමාගේ ඡන්දය කොමසාරිස්වරයා විසින් ඔහුගේ පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළක දී දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක්, නාමයෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකි ය.

(2) එවැනි ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් සතියක් ඇතුළත කොමසාරිස්වරයා විසින් එම ඉල්ලුම් පත්‍රය භාර ගන්නා ලද බව නැතහොත් ප්‍රතික්ෂේප කරන ලද බව එම ඡන්ද හිමියාට දැන්විය යුතු ය. කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) එවැනි ඡන්දයක් දී ඇති අවස්ථාවක එම ඡන්දය, එම ඡන්ද හිමියා ලියාපදිංචි වී ඇති මැතිවරණ කොට්ඨාශයේ ඡන්ද සමග ගණන් කරනු ලැබිය යුතු ය.”.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 129අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ 129අ වන වගන්තිය ඇතුළත් කිරීම.

"කලාපවලට අදාළ **විශේෂ** විධිවිධාන.

129අ. මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මැතිවරණ කොට්ඨාසයක් ගැන මේ පනතේ ඇති සෑම සඳහන් කිරීමකටම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ මැතිවරණ කොට්ඨාසයක් බෙදනු ලැබ ඇති කලාපයක් ගැන සඳහන් කිරීමක් ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපලේඛනයේ "අ" ආකෘතියේ "ඔවුන්ගේ නම් සඳහන් කර ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව" යන වචන ඉවත් කිරීමෙන් ;

(2) එම උපලේඛනයේ "ඇ" ආකෘතිය වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කිරීමෙන් :—

**"ඇ" ආකෘතිය**

**32 වන වගන්තිය**

**ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස ආකෘතිය**

| | | |
|---|---|---|
| **උප පත්‍රිකා අංකය** | **"අ" පක්ෂය** | * |
| **සැලකිය යුතුයි ;** **ඡන්ද පත්‍රිකාවේ පසු පස ඇති අංකයට අනුරූප වූ අංකයක් උප පත්‍රිකාවේ තිබිය යුතුය.** | **"ආ" පක්ෂය** | * |
| | **"ඇ" පක්ෂය** | * |
| **එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ නම සහ 'ස්වාධීන කණ්ඩායම' යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මුද්‍රණය කළ යුතුය.** | **1 වන ස්වාධීන කණ්ඩායම** | * |
| | **2 වන ස්වාධීන කණ්ඩායම** | * |
| | **3 වන ස්වාධීන කණ්ඩායම** | * |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |
| 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | 40 |
| 41 | 42 | 43 | 44 | 45 | 46 | 47 | 48 | 49 | 50 |

* **එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ ලකුණු මෙහි මුද්‍රණය කරන්න**

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපලේඛනයේ "අ" ආකෘතියේ—

(අ) "පහත සඳහන් අනුක්‍රමික අංකය, ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය" යන වචන වෙනුවට "පහත සඳහන් අනුක්‍රමික අංකය, වීදියේ හෝ ගමේ නම, ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "පොලිස් දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ" යන වචන වෙනුවට "පොලිස් දෙපාර්තමේන්තුවේ/බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උපලේඛනයේ "ආ" ආකෘතියේ පිටුපස ඇති 3 වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"3. ඡන්දදායකයා තම ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාම සහ ලකුණ ඉදිරියෙන්, ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ තත් කාර්යය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි කතිර ලකුණක්, මෙසේ "×" යෙදීමෙන් ඡන්දය දිය යුතු වන අතර, එම පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් තුන් දෙනෙකුට නොවැඩි අපේක්ෂකයන් ගණනක් සඳහා ස්වකීය මනාපය පළ කිරීම, ඒ එක් එක් අපේක්ෂකයාට වෙන්කර දී ඇති අනුක්‍රමික අංකයට අනුරූප අනුක්‍රමික අංකය ඇතුළත් කොටුව මත කතිර ලකුණක් යෙදීමෙන් සිදු කළ හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ "ඡන්දදායකයා ආවෘත ස්ථාන" යන වචනවල සිට "යෙදිය යුතුය" යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"සෑම ඡන්දදායකයකු ම, ආවෘත ස්ථාන අතරින් එක් ආවෘත ස්ථානයකට ගොස්, තම ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ නම සහ ලකුණ ඉදිරියෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ අංකය සහ ලකුණ ඉදිරියෙන් හෝ ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ කතිර ලකුණක් (මෙසේ "×") යෙදිය යුතු ය. ඊට පසුව එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් තුන් දෙනකුට නොවැඩි අපේක්ෂකයන් ගණනක් සඳහා ස්වකීය මනාපය පළකිරීම, ඡන්ද පත්‍රිකාවේ අග දැක්වෙන එක් එක් අපේක්ෂකයාට වෙන් කර දී ඇති අනුක්‍රමික අංකයට අනුරූප අනුක්‍රමික අංකය ඇතුළත් කොටුව මත (මෙසේ "×") කතිර ලකුණක් යෙදීමෙන් සිදු කළ හැකි ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාලයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.